# පෙර පාසල් ක්ෂේත්‍ර නිලධාරී (PSFO) වැඩසටහන

## පෙර පාසල් ක්ෂේත්‍ර නිලධාරී (PSFO) වැඩසටහන යනු කුමක්ද ?

පෙර පාසල් ක්ෂේත්‍ර නිලධාරී වැඩසටහන සැලසුම් කර ඇත්තේ වික්ටෝරියානු රජයෙන් ප්‍රතිපාදිත ලබාදෙන බාලාංශ සේවාවන්ට, අමතර අවශ්‍යතා ඇති ළමුන් සඳහා ඇතුලත්වීම, ප්‍රවේශය, ඉගෙනුම සහ වර්ධනය, සහ තේරුම් සහගත සහභාගිත්වය ලබාදීමේ හැකියාව වර්ධනය කරගැනීමට ප්‍රයෝගික උපදෙස් සහ උපකාර ලබා දීම පිණිසය.

PSFO මගින් ශික්ෂකයන්ට ළමුන්ගේ අමතර අවශ්‍යතා හඳුනා ගැනීම, ශික්ෂකයා පුහුණු කිරීම, සුවිශේෂ උපාය මාර්ග ආකෘති කිරීම සහ යොමුකිරීමේ මාවත් හඳුනා ගැනීම පිණිස ආධාර වන, සුවිශේෂ තොරතුරු, සම්පත්, වැඩසටහන් උපාය මාර්ග ඇතුළු ප්‍රායෝගික උපදෙස් සහ උපකාර පරාසයක් සපයනු ලැබේ අමතර අවශ්‍යතා ඇති දරුවන්ගේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන බාලාංශ වැඩසටහනක් සැලසුම් කිරීමට සහ ලබා දීමට අධ්‍යාපනඥයින්ට ඔවුන්ගේ විශ්වාසය, දැනුම සහ කුසලතා ගොඩනැගීමට මෙම සහාය උපකාර කරයි.

## PSFO සේවා ලබා ගැනීමට සුදුසුකම ඇත්තේ කාටද?

වික්ටෝරියානු රජයෙන් ප්‍රතිපාදිත සියලුම බාලාංශ සේවාවන්ට, අමතර බාලාංශ වැඩසටහනකඅවශ්‍යතා ඇති ළමුනට ප්‍රවේශය, ඇතුලත්වීම සහ සහභාගිවීමට උදවු වීම පිණිස වූ PSFO සේවා ලබා ගැනීමට සුදුසුකම තිබේ. වයස අවුරුදු හතරේ බාලාංශයට, ප්‍රතිපාදිත වයස අවුරුදු තුනේ බාලාංශයට සහ මුල් ආරම්භක බාලාංශයට ඇතුලත්වී සිටින ළමුන් මීට ඇතුලත් වේ

## අමතර අවශ්‍යතා ඇති ළමුන්

PSFO වැඩසටහනේදී අමතර අවශ්‍යතා ඇති ළමුන් වර්ධන ගැටලු සහිත ළමුන් ලෙස හඳුන්වයි. භාෂා ප්‍රමාදයන් හෝ අභියෝගාත්මක හැසිරීම් වල සිට බහු ආබාධ සහිත දරුවන් දක්වා දරුවන්ගේ සංවර්ධනයේ ඕනෑම තත්වයක් වර්ධන ගැටලු විය හැක. කම්පන තත්වයක් හේතුවෙන් අමතර අවශ්‍යතා ඇති ළමුන් ද PSFO යොමුකිරීමට සුදුසුකම් ලබයි.

දරුවෙකුගේ සංවර්ධනය සඳහා ජාතික ආබාධිත රක්ෂණ යෝජනා ක්‍රමයක් (NDIS) හෝ ආධාර සපයන්නාගේ මුල් ළමාවිය මැදිහත්වීම් අඛණ්ඩව අනුග්‍රහය දක්වන්නේ නම්, මුල් ළමාවිය අධ්‍යාපනඥයා පවුලේ අය සමඟ සාකච්ඡා කර පළමු අවස්ථාවේදීම මෙම සැපයුම්කරුගෙන් සහය ලබා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. මුල් ළමාවිය මැදිහත්වීමේ වෘත්තිකයන්ට දරුවා තම කාලය ගත කරන වෙනත් සැකසුම් හරහා ක්‍රියාවට නංවන උපාය මාර්ගවලට අනුකූල වන තම සම වයසේ මිතුරන් සමඟ ඉගෙනීමේ අත්දැකීම් සඳහා අර්ථවත් ලෙස සහභාගී වීමට දරුවාට සහාය වන උපාය මාර්ග සැපයිය හැකිය.

## PFSO සේවය සඳහා ගාස්තුවක් අය කෙරේද?

© වික්ටෝරියා ප්‍රාන්තය (අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව) 2021. වෙනත් ආකාරයකින් සටහන් කර ඇති අවස්ථා හැර, මෙම ලේඛනයේ ඇති කරුණු සඳහා Creative Commons Attribution 4.0 International යටතේ සපයා ඇත කරුණාකර සම්පූර්ණ ප්‍රකාශන හිමිකම් දැන්වීම පරීක්ෂා කරන්න

සියලුම රජයේ ප්‍රතිපාදන ලබදෙන බාලාංශ සේවා සඳහා PSFO වැඩසටහනේ පොදු සේවා සඳහා කිසිදු අයකිරීමක් නොමැතිව සිදුකෙරේ.

## PFSO සේවා සපයන්නේ කවුරුන් විසින්ද?

ප්‍රාන්තය පුරා PFSO සේවා ලබාදීම පිණිස අධ්‍යාපන සහ පුහුණු දෙපාර්තමේන්තුව විසින් ප්‍රජා සේවා සංවිධාන සහ පළාත් සභා වලට මුදල් සපයනු ලැබේ. PFSO සේවා බාලාංශ වැඩසටහන සහ පරිසරය තුල ලබාදීමට හැකියාව ඇති කිරීම පිණිස මෙම සේවය විහිදුම් ආකෘතියක් යොදා ගනු ලැබේ.

## PFSO නිලධාරියාගේ සුදුසුකම් මොනවාද?

PFSO නිලධාරියාගේ භූමිකාව බාලාංශ ශික්ෂකයන්ගේ ධාරිතාව වර්ධනය කිරීම බැවින්, PFSO නිලධාරියා උපාධි ලත් මෙන්ම ඉහළ ප්‍රමිතියේ ඇතුලත්වීම සහිත බාලාංශ වැඩසටහන් සැලසුම් කිරීමේ සහ සපයා දීමේ අත්දැකීම් සහිත මුල් ළමාවිය ශික්ෂකයෙක් විය යුතුය.

## PFSO නිලධාරීන් පවුල සමග සේවය කරන්නේද?

PSFO නිලධාරීන් බාලාංශ වැඩසටහන තුල සේවා කටයුතු කරයි PSFO බාලාංශය තුළ සිටින දරුවෙකුට සෘජුවම මැදිහත්වීමක් සිදු නොකරන නමුත් මුල් ළමාවිය අධ්‍යාපනඥයාගේ උපදේශකයෙකු සහ පුහුණුකරුවෙකු ලෙස ක්‍රියා කරයි. මෙම ප්‍රවේශයට බාලාංශයේ දරුවා සහ පවුලේ අය සමඟ සෘජු සම්බන්ධතා ඇති විය හැකි අතරම, කෙසේ වෙතත්, මෙම කාර්යය දරුවා සහ පවුල සමඟ අධ්‍යාපනඥයාගේ අඛණ්ඩ සම්බන්ධතාවයට ගරු කරන ආකාරයෙන් මුල් ළමාවිය අධ්‍යාපනඥයා සමඟ සහයෝගීව සහ හරහා සිදු කෙරේ. PFSO නිලධාරියා විසින් ළමයාව බාලාංශ පරිසරයේදී සෘජුව නිරීක්ෂණය කර ළමයාගේ හැකියාවන් මෙන්ම ඉගෙනුම් සහ වර්ධන අවශ්‍යතා පිළිබඳව ශික්ෂකයාගේ ඇගයුමට දායක වනු ඇත. ළමයාගේ බාලාංශ වැඩසටහන සැලසුම් කිරීමේදී උපකාරී වන සේවා පරාසයක් හඳුනාගැනීමට සහ පවුල් වලට ඒවා සමග සම්බන්ධ වීමටද PFSO නිලධාරියා ශික්ෂකයාට සහාය වනු ඇත.

අමතර අවශ්‍යතා ඇති දරුවෙකුගේ පුද්ගල අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමට PSFO සේවාව මුල් ළමාවිය අධ්‍යාපනඥයින්ට සහාය වන බැවින්, PSFO සහායට පෙර තම දරුවා සමඟ PSFO සම්බන්ධ වීම සඳහා මුල් ළමාවිය අධ්‍යාපනඥයා දෙමාපියන්/භාරකරුවන්/රැකුම් කරුවන්ගෙන් දැනුවත් කැමැත්ත ලබා ගැනීම අවශ්‍ය වේ.

## දෙමාපියන්ට PFSO වැඩසටහන ඇමතීමට පුලුවන්ද?

ප්‍රතිපාදිත බාලාංශ වැඩසටහන් වල සිටින තම ළමයාගේ වර්ධනය පිලිබඳ යම් ගැටළු ඇති දෙමාපියන් එම ගැටළු ගැන මුලින්ම ඔවුන්ගේ මුල් ළමාවිය ශික්ෂකයා සමග සාකච්ඡා කල යුතුය. මාපියෙකු PSFO වැඩසටහනට සෘජුවම සම්බන්ධ වන විට, යොමු කිරීම ප්‍රගතිය සඳහා PSFO අදාළ අධ්‍යාපනඥයා සමඟ සම්බන්ධ වනු ඇත.

## මුල් ළමාවිය ශික්ෂකයන්ගේ ධාරිතාව ගොඩනැගීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

PFSO ධාරිතාව ගොඩනැගීමේ ක්‍රියාවලිය බාලාංශ ශික්ෂකයන්ට මෙසේ උපකාර කරයි:

© වික්ටෝරියා ප්‍රාන්තය (අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව) 2021. වෙනත් ආකාරයකින් සටහන් කර ඇති අවස්ථා හැර, මෙම ලේඛනයේ ඇති කරුණු සඳහා Creative Commons Attribution 4.0 International යටතේ සපයා ඇත කරුණාකර සම්පූර්ණ ප්‍රකාශන හිමිකම් දැන්වීම පරීක්ෂා කරන්න

- ආත්ම විශ්වාසයෙන් යුතුව අභ්‍යාස ක්‍රියාත්මක කිරීමට සහ අමතර අවශ්‍යතා ඇති ළමුන්ගේ පුද්ගලික හැකියාවන්, රුචිකම් සහ අවශ්‍යතා වලට සුප්‍රතිචාරක වැඩසටහන් ඇතුලත් බාලාංශ පරිසරයක් තුල ලබා දීමට අවශ්‍ය දැනුම සහ කුසලතා ලබාගැනීමට
- බාලාංශ වැඩසටහනේ සියලුම දරුවන් සඳහා සැලසුම් කිරීමේ වගකීම සහ හැකියාව යන දෙකම තමන් සතු වන අතර අමතර අවශ්‍යතා ඇති දරුවන්ගේ ඉගෙනීම සහ සංවර්ධනය සඳහා සහාය ලබා දිය හැක්කේ විශේෂඥ කුසලතා ඇති ප්‍රවීණයන්ට පමණක් නොවන බවත් පෙන්වාදීම
- තම ළමයින්ගේ වර්ධනය පිළිබඳව දෙමාපියන්ට ඇති ගැටළු වලට ප්‍රතිචාර දැක්වීමට.

වැඩි විස්තර සඳහා පෙර පාසල් ක්ෂේත්‍ර නිලධාරී වැඩසටහනට (Preschool Field Officer Program) පිවිසෙන්න.



© වික්ටෝරියා ප්‍රාන්තය (අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව) 2021. වෙනත් ආකාරයකින් සටහන් කර ඇති අවස්ථා හැර, මෙම ලේඛනයේ ඇති කරුණු සඳහා Creative Commons Attribution 4.0 International යටතේ සපයා ඇත කරුණාකර සම්පූර්ණ ප්‍රකාශන හිමිකම් දැන්වීම පරීක්ෂා කරන්න

# බාලාංශ වැඩසටහන් සඳහා අනෙකුත් උපකාර

PSFO භූමිකාව අනෙකුත් විශේෂඥ සේවා සහ බාලාංශ ආධාරක මගින් මේවාත් ඇතුලත් උපකාර පරාසයක් ලබාදේ:

- මුල් ළමාවිය ශික්ෂකයන්ගේ වෘත්තීය සංවර්ධනය
- ගුණාත්මක හා නියාමන මුල් ළමාවිය අධ්‍යාපනය සහ රැකවරණ ආධාර
- මුල් වසර කළමනාකරණ සංවිධාන
- LOOKOUT අධ්‍යාපන සහ උපකාර මධ්‍යස්ථාන
- Koorie සම්බන්ධක උපකාරක නිලධාරීන් (KESO) සහ Koorie අධ්‍යාපන සම්බන්ධීකාරකවරුන් (KEC)
- මුල් ළමාවිය මැදිහත්වීමේ වෘත්තිකයන්
- බාලාංශ ඇතුලත් උපකාර වැඩසටහන (Kindergarten Inclusion Support (KIS))
- මුල් ඉගෙනුමට ප්‍රවේශය (Access to Early Learning (AEL))
- පාසලට සූදානම් වීමේ ප්‍රතිපාදන
    - SRE හවුල් සෞඛ්‍ය උපකාර

# PFSO වැඩසටහන සහ පාසලට සූදානම් ප්‍රතිපාදන (SRF ) යටතේ ලබාදෙන උපකාර අතර වෙනස කුමක්ද?

අමතර අවශ්‍යතා ඇති තනි ළමයෙකු ඇතුළත් කර ගැනීමට සහාය වීම සඳහා සහාය ඉල්ලා සිටින මුල් ළමාවිය අධ්‍යාපනඥයකුට ප්‍රතිචාර වශයෙන් අරමුදල් සපයන බාලාංශ වැඩසටහන් සඳහා PSFO සේවාව ලබා ගත හැකිය. PSFO විසින් සපයනු ලබන උපාය මාර්ග බාලාංශ පරිසරයක් තුළ එක් එක් දරුවාගේ අවශ්‍යතා සැලසුම් කිරීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට මුල් ළමාවිය අධ්‍යාපනඥයාගේ හැකියාව වැඩි දියුණු කරයි.

SRF යනු අධ්‍යාපනික අවාසි ආමන්ත්‍රණය කිරීම සඳහා අමතර අරමුදල් වන අතර බාලාංශ සේවයකට සහභාගී වන ළමුන්ගේ කණ්ඩායමේ අධ්‍යාපන අවශ්‍යතා ඉලක්ක කර ඇත. සන්නිවේදනය (භාෂා සංවර්ධනය), යහපැවැත්ම (සමාජ චිත්තවේගීය) සහ ප්‍රවේශය සහ ඇතුළත් කිරීම යන ප්‍රමුඛතා ක්ෂේත්‍ර තුනෙහි ළමුන්ගේ ඉගෙනීමට සහ සංවර්ධනයට සහාය වීම සඳහා අධ්‍යාපනඥයින්ගේ සහ පවුල්වල කුසලතා සහ දැනුම ගොඩනගන වැඩසටහන් සහ ආධාරක පරාසයකට SRF ප්‍රවේශය සපයයි.

වැඩි විස්තර සඳහා, පාසල් සූදානම අරමුදල් වෙත පිවිසෙන්න

© වික්ටෝරියා ප්‍රාන්තය (අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව) 2021. වෙනත් ආකාරයකින් සටහන් කර ඇති අවස්ථා හැර, මෙම ලේඛනයේ ඇති කරුණු සඳහා Creative Commons Attribution 4.0 International යටතේ සපයා ඇත කරුණාකර සම්පූර්ණ ප්‍රකාශන හිමිකම් දැන්වීම පරීක්ෂා කරන්න